NILIS

# පුස්තකාලයාධිපතිත්ව උසස් සහතිකපත්‍ර පාඨමාලාව

## Advanced Certificate in Librarianship (පාඨමාලා කේතය: ACL)

ACL 2026/2027

### 1) හැඳින්වීම

පුස්තකාලයාධිපතිත්ව උසස් සහතිකපත්‍ර පාඨමාලාව (ACL) ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි SLQF 02 මට්ටමට අනුකූලව පිරිනමනු ලබන අතර, සහභාගිවන්නන්ගේ පුස්තකාලයාධිපතිත්ව දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම අරමුණු කර ගෙන මෙම පාඨමාලාව සැලසුම් කර ඇත. ACL පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීම අපගේ (SLQF 3 මට්ටමෙහි) ඩිප්ලෝමා පාඨමාලාවකට ඇතුලත්වීමට සුදුසුකමක් ලෙස ද සැලකේ.

### 2) ඉලක්ක කණ්ඩායම

අ.පො.ස.(සා.පෙළ) සමතුන් සහ පුස්තකාල පිළිබඳ කෙටි කාලීන පුහුණුවක් පමණක් අවශ්‍ය සිසුන් සඳහා.

### 3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්

පාඨමාලාවට ඇතුළත් වීමට අවශ්‍ය අවම සුදුසුකම්

- **අ.පො.ස.(සා.පෙළ)** විෂයයන් හයක් සමත් වීම.

**හෝ**

- **ඕනෑම විෂය ධාරාවක් ඔස්සේ ජාතික වෘත්තීය නිපුණතා 03 මට්ටම ( NVQ Level 3) හෝ ඉහළ මට්ටමක් සමත්වී තිබීම.**

**සහ**

**තෝරාගැනීමේ පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය සමත්වීම.**

### 4) ඉගෙනුම් ඵල


මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව,

- විවිධ අවශ්‍යතා සහ අරමුණු සහිත පුද්ගලයන්ට සේවය කිරීම සඳහා පුස්තකාල ක්‍රියාත්මක වන ආකාරය නිදර්ශනය කිරීමට
- සාමාන්‍ය පුස්තකාල කාර්යයන් සම්පූර්ණ කිරීමට
- ප්‍රධාන තොරතුරු මූලාශ්‍ර හඳුනාගැනීමට
- මූලික සන්නිවේදනය සහ තොරතුරු ලබා ගැනීම සඳහා ICT සහ ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමට
- කියවීම ප්‍රවර්ධනය කිරීමට
- පුස්තකාල බාහිර ක්‍රියාකාරකමක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට

සහභාගිවන්නාට හැකි වනු ඇත

### 5) වැඩසටහනේ වැදගත්කම:

**ඔබ** අ.පො.ස./උ.පෙ සම්පූර්ණ කර නොමැති නම්, ACL පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූප සටහනේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන (SLQF Level 3) ඩිප්ලෝමා පාඨමාලා තුනෙන් එකකට ඇතුලත් වී උසස් ඩිප්ලෝමාව (SLQF Level 4) දක්වා ඉදිරියට යාමට හැකි වේ.




ACL: පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
DLIM: පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමාව
DPL: මහජන පුස්තකාලධිපතිත්ව ඩිප්ලෝමාව
DSL: පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමාව
HDLIM I: පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමාව I
HDLIM II: පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමාව II

## 6) පාඨමාලාවට අන්තර්ගත විෂයයන්

i. වෘත්තීය අධ්‍යයනය සඳහා සූදානම් වීම
(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ඉංග්‍රීසි)
ii. පුස්තකාලය පිළිබඳ හැඳින්වීම
iii. එකතුව සංවර්ධනය සහ කළමනාකරණය
iv. තොරතුරු සේවා
v. පුස්තකාල වර්ග
vi. ව්‍යාපෘතිය

7) **පාඨමාලා කාලය :** මාස 06 (දේශන වැඩි ප්‍රමාණයක් මාර්ගගතව පැවැත්වේ).

8) **මාධ්‍ය -** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී)

9) **ඇගයීම් ක්‍රමවේදය:** සෑම විෂයක් සඳහාම ලබාදෙන ඇගයීම් ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම මගින්.

## 10) පුස්තකාලයාධිපතිත්ව සහතිකපත්‍රය ලබා ගැනීමට නම්

පුස්තකාලයාධිපතිත්ව සහතිකපත්‍රය ලබා ගැනීමට නම් පාඨමාලා ලාභීන් සෑම විෂයයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය.

11) **පාඨමාලා ගාස්තු:** රු.40,000/= (එක් වාරිකයක් පමණි)

## 12) අයදුම් කරන ආකාරය

**i.** අපගේ වෙබ් අඩවියෙන් (nilis.cmb.ac.lk) මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) සම්පූර්ණ කරන්න..

**ii.** උප්පැන්න සහතිකයේ, අධ්‍යාපන සහතිකවල සහ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපත් උඩුගත කරන්න.

**iii.** මහජන බැංකුව, තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100101191736 දරන ගිණුමට අයදුම්පත් ගාස්තුව ලෙස රු.1000.00 ගෙවා, රිසිට් පත උඩුගතකරන්න.
( අයදුම්පත් ගාස්තු ගෙවීමේදී පාඨමාලාව හඳුනාගැනීමේ අංකය : 21301S12600 සටහන් කිරීම අනිවාර්ය වේ)




"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03"

දුරකථන: 011 2507150 / 0701478619